# ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර වල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම

- ගිණුම් තැබීමේ අවශ්‍යතාව
- සාමාජික මුදල් ගිණුම
- යාවජීව සාමාජික මුදල් ගිණුම්
- පරිත්‍යාග ගිණුම් ගත කරන ආකාරය
- සමුච්චිත අරමුදල
- ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම

## ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් යනු

සාමාජික හා සමාජ සුභ සාධනයට හා අභිවෘද්ධිය අරමුණු කරගත් සංවිධාන ලාභ අරමුණු කර නොගත් සංවිධාන ලෙස හැඳින්වෙයි

උදාහරණ

- ✓ ක්‍රීඩා සමිති
- ✓ අවමංගල්‍යාධාර සමිති
- ✓ තරුණ සංවිධාන
- ✓ ආගමික සංවිධාන
- ✓ සුභ සාධන සමිති

## ලාභ අරමුණු කර නොගත් සංවිධාන වල ගිණුම් තැබීම අවශ්‍ය වන්නේ ඇයි

- ➢ සාමාජිකයන් හා වෙනත් ඇල්මැති පාර්ශවයන් දැනුවත් කිරීමට
- ➢ සාමාජික ආරවුල් අවම කරමින් විශ්වාසය දිනා ගැනීමට
- ➢ සංවිධානයේ ඉදිරි කටයුතු සැලසුම් කිරීමට
- ➢ සංවිධානය කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාමට

## ලාභ අරමුණු කර නොගත් සංවිධාන සකස් කරන ගිණුම් සහ වාර්තා

ලැබීම් හා ගෙවීම් ගිණුම → මුදල් ලැබීම් සහ ගෙවීම් සටහන් කිරීම

සාමාජික මුදල් ගිණුම → වර්ෂයට අදාල සාමාජික මුදල ගණනය කිරීම

ආදායම් ප්‍රකාශය → වර්ෂයෙ ක්‍රියාකාරිත්වය පෙන්වීමට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය → වත්කම් වගකීම් හා හිමිකම් වල තත්ත්වය දැන ගැනීමට

බාහිර ක්‍රියාකාරකම් වල ආදායම් ප්‍ර → බාහිර ක්‍රියාකාරකම් වල ප්‍රතිඵලය දැනගැනීමට

## ලැබීම් හා ගෙවීම් ගිණුම ( මුදල් ගිණුම)

ගිණුම් කාලච්ඡේදය තුළ සංවිධානයක මුදලින් ලැබුනු සහ මුදලින් ගෙවූ වටිනාකම් පමණක් සාරාංශ කර ඇතුලත් කරන ගිණුම **ලැබීම් හා ගෙවීම් ගිණුම** ලෙස හැදින්වේ මෙය මුදල් පදනම මත පිළියෙල කරයි·

**අභ්‍යාස 1**

රණසිංහ ක්‍රීඩා සමාජයේ 2019 /12/31 අවසන් වර්ෂය තුළ මුදල් ගණුදෙනු මෙසේය·

| | |
|---|---|
| ආරම්භක ශේෂය 2019/1/1 | රු· |
| මුදල් | 12 000 |
| බැංකු | 2 000 |
| සංගීත ප්‍රසංග ලැබීම් | 20 000 |
| ලද සාමාජික මුදල් | 14 000 |
| ක්‍රීඩා භාණ්ඩ මිලට ගැනුම් | 13 000 |
| ලද පරිත්‍යාග මුදල් | 5 000 |
| ගෙවල් කුලී ගෙවීම් | 1 000 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 400 |
| විදුලි ගාස්තු | 600 |
| පුවත්පත් සඟරා මිලට ගැනීම් | 800 |
| පරණ පුවත්පත් විකුණා ලැබූ මුදල් | 200 |
| තැපැල් හා දුරකථන ගාස්තු | 500 |

- ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කරන්න

## අභ්‍යාස 1 පිළිතුරු

| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|
| 19/1/1 | ඉ/ ගෙ / ශේෂය | 14000 | | ක්‍රීඩා භාණ්ඩ ගැනුම් | 13000 |
| | සංගීත ප්‍රසංග ලැබීම් | 20000 | | ගෙවල් කුලී | 1000 |
| | ලද සාමාජික මුදල් | 14000 | | ලිපි ද්‍රව්‍ය වියදම් | 400 |
| | ලද පරිත්‍යාග මුදල් | 5000 | | විදුලි ගාස්තු | 600 |
| | පුවත්පත් විකුණා ලැ මුදල් | 200 | | පුවත්පත් සඟරා ගැනීම් | 800 |
| | | | | තැපැල් හා දුරකථන | 500 |
| | | | 19/12/31 | ප/ ගෙ / ශේෂය | 36900 |
| | | 53200 | | | 53200 |
| 20/12/31 | ඉ/ ගෙ / ශේෂය | 36900 | | | |

## සාමාජික මුදල් ගිණුම

ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ආදායම් මාර්ගය **සාමාජික මුදල්** බැවින් ඒ සඳහා සාමාජික මුදල් ගිණුමක් පවත්වා ගනී·

### සාමාජික මුදල් ගිණුමේ අන්තර්ගත තොරතුරු

- ✓ වර්ෂයේ ආරම්භක දිනට කලින් ලද සාමාජික මුදල්
  ලැබිය යුතු සාමාජික මුදල්
- ✓ වර්ෂයෙ අවසාන දිනට කලින් ලද සාමාජික මුදල්
  ලැබිය යුතු සාමාජික මුදල්
- ✓ වර්ෂය තුළ ලැබූ සාමාජික මුදල්
- ✓ වර්ෂයට අදාළ සාමාජික මුදල්

## සාමාජික මුදල් ගිණුම්

### සාමාජික මුදල් ගිණුම

| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|
| ★★★★ | ඉදිරියට ගෙන ආ ශේෂය | ★★★★ | ★★★★ | ඉදිරියට ගෙන ආ ශේෂය | ★★★★ |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල) | |
| | ආදායම් හා වියදම් ගිණුම | ★★★★ | | මුදල් | ★★★★ |
| | (ආදායම් ප්‍රකාශය) | | | (මුදලින් ලද සාමාජික මුදල) | |
| ★★★★ | පහලට ගෙන යන ශේෂය | ★★★★ | ★★★★ | පහලට ගෙන යන ශේෂය | ★★★★ |
| | (කලින් ලද සාමාජික මුදල් ) | | | (ලැබිය යුතු සාමාජික මුදල) | |
| | | ★★★★ | ★★★★ | | ★★★★ |

## අභ්‍යාස 2

රණමයුර ක්‍රීඩා සමාජයේ පහත තොරතුරු ඇසුරෙන් සාමාජික මුදල් ගිණුම් සකස් කරන්න

2019/1/1 දිනට තොරතුරු

හිඟහිටි සාමාජික මුදල් රු 1800

කලින් ලද සාමාජික මුදල් රු 1600

2019/12/31 දිනට තොරතුරු

හිඟහිටි සාමාජික මුදල් රු 2200

කලින් ලද සාමාජික මුදල් රු 1400

2019 මුදලින් ලද සාමාජික මුදල් රු 45400

## අභ්‍යාස 2 පිළිතුරු

**සාමාජික මුදල් ගිණුම**

| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|
| 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1800 | 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1600 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල) | |
| | ආදායම් හා වියදම් ගිණුම | 46000 | | මුදල් | 45400 |
| | (ආදායම් ප්‍රකාශය) | | | (මුදලින් ලද සාමාජික මුදල) | |
| 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 1400 | 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 2200 |
| | (කලින් ලද සාමාජික මුදල් ) | | | (ලැබිය යුතු සාමාජික මුදල) | |
| | | 49200 | | | 49200 |
| 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 2200 | 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1400 |

## අභ්‍යාස 3

2019 වසරේ පිපෙන තරු ක්‍රීඩා සමාජයේ සාමාජික මුදල් පිළිබඳව තොරතුරු මෙසේය

| | | |
|---|---|---|
| 2019/ 1/1 දිනට | ලැබිය යුතු සාමාජික මුදල් | රු 600 |
| | කලින් ලද සාමාජික මුදල් | රු 400 |
| 2019 12 31 දිනට | ලැබිය යුතු සාමාජික මුදල් | රු 4500 |
| | කලින් ලද සාමාජික මුදල් | රු 1500 |

2019/12/31 අවසන් වර්ෂයේ මුදලින් ලද සාමාජික මුදල් රු 28500

**අවශ්‍ය වන්නේ**

- 2019 /12/31 න් අවසන් වර්ෂයේ සාමාජික මුදල් ගිණුම් පිළියෙල කර ආදායම් වියදම් ගිණුමට බැර කළ යුතු සාමාජික මුදල ගණනය කරන්න

## අභ්‍යාස 3 පිළිතුරු

| සාමාජික මුදල් ගිණුම | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
| 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 600 | 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 400 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල) | |
| | ආදායම් හා වියදම් ගිණුම | 31300 | | මුදල් | 28500 |
| | (ආදායම් ප්‍රකාශය) | | | (මුදලින් ලද සාමාජික මුදල්) | |
| 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 1500 | 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 4500 |
| | (කලින් ලද සාමාජික මුදල් ) | | | (ලැබිය යුතු සාමාජික මුදල) | |
| | | 33400 | | | 33400 |
| 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 4500 | 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1500 |

**අභ්‍යාස 4**

2019 වසරේ යොවුන් ක්‍රීඩා සමාජයේ සාමාජික මුදල් පිළිබඳ තොරතුරු මෙසේය

2019 /1/1 දිනට කලින් ලද සාමාජික මුදල රු 8000

ලැබිය යුතු සාමාජික මුදල රු 5000

2019 වර්ෂය තුළ සාමාජික මුදල් ලැබීම්

| | |
|---|---|
| 2018 සඳහා | රු 4000 |
| 2019 සඳහා | රු 25000 |
| 2020 සඳහා | රු 6000 |

වර්ෂය අවසානයේ දී 2019 වර්ෂයට අදාළ හිඟ සාමාජික මුදල් රු 2000

අවශ්‍ය වන්නේ ඃ

2019 වර්ෂයේ සාමාජික මුදල් ගිණුම

## 4 පිළිතුරු

**සාමාජික මුදල් ගිණුම**

| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|
| 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 600 | 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 400 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල) | |
| | ආදායම් හා වියදම් ගිණුම | 31300 | | මුදල් | 28500 |
| | (ආදායම් ප්‍රකාශය) | | | (මුදලින් ලද සාමාජික මුදල්) | |
| 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 1500 | 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 4500 |
| | (කලින් ලද සාමාජික මුදල් ) | | | (ලැබිය යුතු සාමාජික මුදල) | |
| | | 33400 | | | 33400 |
| 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 4500 | 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1500 |
| | | 46000 | | | 46000 |
| 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 3000 | 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 6000 |

**අභ්‍යාස 5**

සුමිරු ක්‍රීඩා සමාජයේ පහත් තොරතුරු ඔබට සපය යි

2019 /4/1 දිනට හිඟ සාමාජික මුදල් රු 1800

2019 /4/1 දිනට කලින් ලද සාමාජික මුදල් රු 2400

2019 /2020 වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල් පහත පරිදි වේ

2018 /2019 වෙනුවෙන් රු 1500

2019 /2020 සඳහා රු 30 000

2020 /2021 සදහා රු 2000

2019 වර්ෂය සඳහා රු 1500 සාමාජික මුදල් හිඟ ව ඇත

ඇත්තටම 1500ද?

අවශ්‍ය වන්නේ ඃ

2019 වර්ෂයේ සාමාජික මුදල් ගිණුම

**අභ්‍යාස 5 පිළිතුරු**

**සාමාජික මුදල් ගිණුම**

| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|
| 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1800 | 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 2400 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල) | |
| | ආදායම් හා වියදම් ගිණුම | 33900 | | මුදල් | 33500 |
| | (ආදායම් ප්‍රකාශය) | | | (මුදලින් ලද සාමාජික මුදල්) | |
| 20/3/31 | පහලට ගෙන යන ශේෂය | 2000 | 20/3/31 | පහලට ගෙන යන ශේෂය | 1800 |
| | (කලින් ලද සාමාජික මුදල් ) | | | (ලැබිය යුතු සාමාජික මුදල) | |
| | | 37700 | | | 37700 |
| 20/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1800 | 20/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 2000 |

**2020/3/31 පහලට ගෙනා ශේෂය සොයන ආකාරය**

| | |
|---|---|
| 19/4/1 ට හිඟ | 1800 |
| 2018/19 සදහා ලද | -1500 |
| | 300 |
| 2019/20 සදහා හිඟ | 1500 |
| | 1800 |

## හිඟහිටි සාමාජික මුදල් කපා හැරීම

සාමාජිකත්වය අහෝසි වීම නිසා හෝ සංවිධානය විසින් ගත් තීරණයක් මත සාමාජික මුදල් කපා හරින අවස්ථා ඇත· එහිදී කපා හරින ප්‍රමාණය පහත පරිදි සටහන් කළ යුතුයි·

> ආදායම් වියදම් ගිණුම හර
>
> සාමාජික මුදල් ගිණුම බැර

**අභ්‍යාස 6**

රණසිංහ ක්‍රීඩා සමාජයේ පොත් වලින් උපුටා ගත් 2019 වර්ෂයට අදාළ තොරතුරු පහත් පරිදි වේ·

වර්ෂයකට රුපියල් 50 බැගින් සාමාජික මුදල් ගෙවන සාමාජික ගණන් 750

2019 /1 /1 දිනට

ලැබිය යුතු සාමාජික මුදල් රු 2000

කලින් ලද සාමාජික මුදල් රු 800

2019 වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල්

2018 වෙනුවෙන් රු 1500

2019 වෙනුවෙන් රු 25000

2020 වෙනුවෙන් රු 1200

2018 වෙනුවෙන් නොලැබුණු සාමාජික මුදල් කපා හැරීමටත් සාමාජිකත්වය අහෝසි කිරීමට තීරණය විය ·

**අවශ්‍ය වන්නේ**

2019 වර්ෂයේ සාමාජික මුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශ වලින් උපුටාගත් කොටස්

## අභ්‍යාස 6 පිළිතුරු

| සාමාජික මුදල් ගිණුම | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
| 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 2000 | 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 800 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල්) | |
| | ආදායම් හා වියදම් ගිණුම | 37000 | | මුදල් | 27700 |
| | (ආදායම් ප්‍රකාශය) (740 ×50) | | | ආදායම් වියදම් ගිණුම | 500 |
| 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 1200 | 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 11200 |
| | (කලින් ලද සාමාජික මුදල් ) | | | (ලැබිය යුතු සාමාජික මුදල්) | |
| | | 40200 | | | 40200 |
| 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 11200 | 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1200 |

| ආදායම් ප්‍රකාශයේ උපුටා ගැනීම් | |
|---|---|
| ආදායම | |
| සාමාජික මුදල් ගිණුම | 37000 |
| | |
| වියදම් | |
| සාමාජික මුදල් කපා හැරීම | 500 |
| | |

| පහලට ගෙන යන ශේෂය 11200 | |
|---|---|
| වාර්ෂික සාමාජික මුදල් | 50×740=37000 |
| -මුදලින් ලද සාමාජික මුදල් | = 25000 |
| -කලින් ලද සාමාජික මුදල් | = 800 |
| හිඟ සාමාජික මුදල් | =11200 |

| 20 /12/31 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උපුටා ගැනීම් | |
|---|---|
| ජංගම වත්කම් | |
| ලැබිය යුතු සාමාජික මුදල් | 11200 |
| | |
| ජංගම වගකීම් | |
| කලින් ලද සාමාජික මුදල් | 1200 |
| | |

## අභ්‍යාස 7

රන්දිය ක්‍රීඩා සමාජයේ පොත තුලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත ·

වර්ෂයකට රු 50 බැගින් සාමාජික මුදල් ගෙවන සාමාජික සංඛ්‍යාව 800 කි·

| | | | | |
|---|---|---|---|---|
| 2019/1/1 දින ලැබී යුතු සාමාජික මුදල් | | | රු | 1500 |
| කලින් ලද සාමාජික මුදල් | | | රු | 900 |
| 2019 වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල් | 2018 | වෙනුවෙන් | රු | 1000 |
| | 2019 | වෙනුවෙන් | රු | 26000 |
| | 2020 | වෙනුවෙන් | රු | 600 |

2018 වර්ෂයේ නොලැබුන සාමාජික මුදල් කපා හැරීමටත් තීරණය විය

**අවශ්‍ය වන්නේ**

2019 වර්ෂයේ සාමාජික මුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශ වලින් උපුටාගත් කොටස්

## අභ්‍යාස 7 පිළිතුරු

**සාමාජික මුදල් ගිණුම**

| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|
| 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1500 | 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 900 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල) | |
| | ආදායම් හා වියදම් ගිණුම | 39500 | | මුදල් | 27600 |
| | (ආදායම් ප්‍රකාශය) (790 ×50) | | | ආදායම් වියදම් ගිණුම | 500 |
| 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 600 | 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 12600 |
| | (කලින් ලද සාමාජික මුදල් ) | | | (ලැබිය යුතු සාමාජික මුදල) | |
| | | 41600 | | | 41600 |
| 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 12600 | 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 600 |

| ආදායම් ප්‍රකාශයේ උපුටා ගැනීම් | |
|---|---|
| ආදායම් | |
| සාමාජික මුදල් ගිණුම | 39500 |
| | |
| වියදම් | |
| සාමාජික මුදල් කපා හැරීම් | 500 |
| | |

| පහලට ගෙන යන ශේෂය 12600 | |
|---|---|
| වාර්ෂික සාමාජික මුදල් | 50×790=39500 |
| -මුදලින් ලද සාමාජික මුදල් | = 26000 |
| -කලින් ලද සාමාජික මුදල් | = 900 |
| **හිඟ සාමාජික මුදල්** | **=12600** |

| 20 /12/31මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උපුටා ගැනීම් | |
|---|---|
| ජංගම වත්කම් | |
| ලැබිය යුතු සාමාජික මුදල් | 12600 |
| | |
| ජංගම වගකීම් | |
| කලින් ලද සාමාජික මුදල් | 600 |
| | |

## අභ්‍යාස 8

රන්ගිරි ක්‍රීඩා සමාජයේ පොත් වලින් පහත තොරතුරු උපුටා ගෙන ඇත ·

2019 /1/1 දින ලැබිය යුතු සාමාජික මුදල් රු 1600

කලින් ලද සාමාජික මුදල් රු 750

2019 වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල් රු

2018 වෙනුවෙන් රු 1000

2019 වෙනුවෙන් රු 24000

2020 වෙනුවෙන් රු 2000

වර්ෂයකට රු 30 බැගින් සාමාජික මුදල් ගෙවන සාමාජික සංඛ්‍යාව 1500

2018 වර්ෂයේ නොලැබුණු සාමාජික මුදල් කපා හැරීමට තීරණය විය ·

**අවශ්‍ය වන්නේ**

2019 වර්ෂයෙ සාමාජික මුදල් ගිණුම මූල්‍ය ප්‍රකාශ වලින් උපුටාගත් කොටස්

## අභ්‍යාස 8 පිළිතුරු

| සාමාජික මුදල් ගිණුම | | | | | |
|---|---|---|---|---|---|
| **දිනය** | **විස්තරය** | **වටනාකම** | **දිනය** | **විස්තරය** | **වටනාකම** |
| 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1600 | 19/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 750 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල්) | |
| | ආදායම් හා වියදම් ගිණුම | 44400 | | මුදල් | 27000 |
| | (ආදායම් ප්‍රකාශය) (1480×30) | | | ආදායම් වියදම් ගිණුම | 600 |
| 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 2000 | 19/12/31 | පහලට ගෙන යන ශේෂය | 19650 |
| | (කලින් ලද සාමාජික මුදල් ) | | | (ලැබිය යුතු සාමාජික මුදල) | |
| | | 48000 | | | 48000 |
| 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 19650 | 20/1/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 2000 |

| 20 /12/31මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උපුටා ගැනීම් | |
|---|---|
| ජංගම වත්කම් | |
| ලැබිය යුතු සාමාජික මුදල් | 19650 |
| | |
| ජංගම වගකීම් | |
| කලින් ලද සාමාජික මුදල් | 2000 |
| | |

| ආදායම් ප්‍රකාශයේ උපුටා ගැනීම් | |
|---|---|
| ආදායම් | |
| සාමාජික මුදල් ගිණුම | 44400 |
| | |
| වියදම් | |
| සාමාජික මුදල් කපා හැරීම | 600 |
| | |

| පහලට ගෙන යන ශේෂය 19650 | |
|---|---|
| වාර්ෂික සාමාජික මුදල් | 50×740=44400 |
| -මුදලින් ලද සාමාජික මුදල් | = 24000 |
| -කලින් ලද සාමාජික මුදල් | = 750 |
| හිඟ සාමාජික මුදල් | =19650 |

## යාවජීව සාමාජික මුදල

මාසිකව හෝ වාර්ෂිකව යම් කාලච්ඡේදයට වරක් සාමාජික මුදල් ගෙවා සාමාජිකත්වය පවත්වා ගන්නවා වෙනුවට සංවිධානය විසින් තීරණය කරන නිශ්චිත මුදලක් එකවර ගෙවා මුළු ජීවිත කාලයටම එකවර සාමාජිකත්වය ලබා ගැනීමට ඉඩ දෙන අවස්ථා ඇත ·

මෙවැනි සාමාජිකයන් **යාවජීව සාමාජිකයන්** වන අතර ලැබෙන සාමාජික මුදල් යාවජීව සාමාජික මුදල් වේ ·

- **යාවජීව සාමාජික මුදල් ලැබෙන විට**

  මුදල් ගිණුම **හර**

  යාවජීව සාමාජික මුදල් ගිණුම **බැර**

- **යාවජීව සාමාජික මුදල් වර්ෂයේ ආදායමක් සසේ සලකා ආදායම් වියදම් ගිණුමට මාරු කරන විට**

  යාවජීව සාමාජික මුදල් ගිණුම **හර**

  ආදායම් ප්‍රකාශය/ සාමාජික මුදල් ගිණුම **බැර**

## අභ්‍යාස 9

පිපෙන තරු ක්‍රීඩා සමාජයේ පහත තොරතුරු ඔබට සපයා ඇත

| | 2019/4/1 | 2020/3/31 |
|---|---|---|
| හිඟහිටි සාමාජික මුදල් | 4000 | 5400 |
| කලින් ලද සාමාජික මුදල් | 1500 | 900 |

2019/ 2020 වර්ෂය තුළදී සාමාජික මුදල් රු 48000 වූ අතර යාවජීව සාමාජික මුදල් ප්‍රමාණය රු14000කි ·යාවජීව සාමාජික මුදල් වලින් වර්ෂයට අදාළ වන්නේ රු1000 පමණි ·2019 /4/1 දිනට හිඟ සාමාජික මුදල් වලින් රු.500 කපා හැරීමට තීරණය විය 2020/3/31 දින හිග හිටි ශේෂය කපා හල සාමාජික මුදල් ඉවත් කර ගණනය කර ඇත

**අවශ්‍ය වන්නේ**

- සාමාජික මුදල් ගිණුම යාවජීව සාමාජික මුදල් ගිණුම

# ආදායම් ප්‍රකාශය /ආදායම් වියදම් ගිණුම්

ලාභ අරමුණු කර නොගත් සංවිධාන කිසියම් කාලච්ඡේදය තුළ නිරත වූ ක්‍රියාකාරකම් මෙහෙයුම් ප්‍රතිඵල ගණනය කිරීම් සඳහා පිළියෙල කරන ලේඛනය ආදායම් ප්‍රකාශය නමින් හඳුන්වයි ·ලාභ ලාභ ප්‍රකාශයය පිළියෙල කිරීමේදී අනුගමනය කරන මූලික නීති රීති මෙහිදී ද අනුගමනය කළ යුතුය · උපචිත සංකල්පයට අනුව කාලච්ඡේදයට අදාළ ආදායම් සහ වියදම් මෙම ප්‍රකාශයට ඇතුළත් කරයි ·

## අතිරික්තය

ආදායම් වියදම් ගිණුම් තුලනය කිරීමේ දී වියදම ඉක්මවා ආදායම් ඇති අවස්ථාවකදී ඒ වෙනස හඳුන්වන්නේ අතිරික්තය ලෙසය ·

## ඌනතාවය

ආදායම් ඉක්මවා වියදම ඇති අවස්ථාවක ඒ වෙනස හඳුන්වන්නේ ඌනතාවය ලෙසය

## ආදායම් ප්‍රකාශයෙ ආකෘතිය

············· සමිතියෙ 2019/12/31 න් අවසන් වර්ෂය සඳහා

ආදායම් ප්‍රකාශය

| **ආදායම්** | | |
|---|---|---|
| සාමාජික මුදල් | ★★★★ | |
| ඇතුලත් වීමේ ගාස්තු | ★★★★ | |
| යාවජීව සාමාජික මුදල් | ★★★★ | |
| කුලී ආදායම් | ★★★★ | |
| ආපනශාලා ලාභය | ★★★★ | |
| සංගීත් සංදර්ශන ආදායම් | ★★★★ | |
| සමරූ කළඹ ආදායම් | ★★★★ | ★★★★ |
| **වියදම්** | | |
| දුරකථන ගාස්තු | ★★★★ | |
| කපකපා හළ .ළ සාමාජික මුදල් | ★★★★ | |
| සේවක වැටුප් | ★★★★ | |
| ලිපිද්‍රව්‍ය මුද්‍රණ වියදම් | ★★★★ | |
| පුවත්පත් වියදම් | ★★★★ | |
| ක්‍රීඩා තරඟ වියදම් | ★★★★ | |
| උපකරණ ක්ෂය | ★★★★ | |
| ලී බඩු ක්ෂය | ★★★★ | (★★★★) |
| **ඌනතාවය /අතිරික්තය** | | ★★★ |
| සමුච්චිත අරමුදල ගෙන ගියා | | |

## ආදායම් ප්‍රකාශය හා ලාභ ලාභ ප්‍රකාශය අතර වෙනස්කම්

| ආදායම් ප්‍රකාශය | ලාභ ලාභ ප්‍රකාශය |
|---|---|
| ලාභ අරමුණු කර නොගත් සංවිධාන වල කාර්ය සාධනය සෙවීම් සඳහා සක්සයි | ලාභ අරමුණු කරගත් සංවිධාන වල කාර්ය සාධනය සෙවීමට සකසයි |
| වියදම් ඉක්මවූ ආදායම් අතිරික්තය ලෙසත් | වියදම ඉක්මවූ ආදායම ලාභය ලෙසත් |
| ආදායම ඉක්මවූ වියදම ඌණතාවය ලෙස සැලකේ | ආදායම් ඉක්මවූ වූ වියදම අලාභය් සැලකේ |

## ලැබීම් ගෙවීම් ගිණුමත් ආදායම් වියදම් ගිණුමත් අතර වෙනස්කම්

| ලැබීම් ගෙවීම් ගිණුම | ආදායම් වියදම් ගණුම් |
|---|---|
| කාලච්ඡේදය තුළ සිදු වූ සියලු ලැබීම් ගෙවීම් සටහන් කරයි | කාලච්ඡේදයට අදාළ ආදායම් වියදම් සටහන් කරයි |
| මුදල් පදනම අනුගමනය කරයි | උපචිත පදනම අනුගමනය කරයි |
| අවසාන ශේෂය තුළින් අතිරික්තය මුදල් ප්‍රමාණය පෙන්වයි | අවසාන ශේෂය තුළින් අතිරික්තය හෝ ඌනතාවය පෙන්වයි |
| අවසාන ශේෂය වත්කමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සටහන් කරයි | අවසාන ශේෂය සමුච්චිත අරමුදලට එකතු කරයි |

## සමුච්චිත අරමුදල

.

මූලික වශයෙන්ම සාමාජිකයින්ගෙන් අයකරන සාමාජික මුදල් වලින් ඇරඹෙන අරමුදලයි· කාලච්ඡේදය අවසානයේ ආදායම් ප්‍රකාශයෙ අතිරික්තය හෝ ඌනතාවය අනුව සාමුච්චිත අරමුදල් අඩු වැඩි වීම සිදුවෙයි· මෙලෙස වර්ෂයෙන් වර්ෂය අතිරික්තයන් එකතු වීමෙන් හා ඌනතාවයන් අඩුවීමෙන් ගොඩනැගෙන අරමුදල **සමුච්චිත අරමුදල** ලෙස හැඳින්වේ·

**සමුච්චිත අරමුදල = වත්කම් – වගකීම්**

## අභ්‍යාස 10

සහන මරණාධාර සමිතියේ දෙදහස් 2019 12 31 දිනට තිබූ වත්කම් හා වග වගකීම් මෙසේය·

| | |
|---|---|
| ලී වබඩු උපකරණ | 50000 |
| අත ඉතිරි මුදල් | 12000 |
| කලින් ලද සාමාජික මුදල් | 3500 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 6000 |
| ණය හිමියෝ | 4000 |
| උපකරණ | 15000 |
| බැංකු ගිණුමේ මුදල් | 20000 |

### අවශ්‍ය වන්නේ

2019 /12/31 දිනට තත්ත්ව විස්තරයක් පිළියෙල කර සමුච්චිත අරමුදල ගණනය කරන්න

## අභ්‍යාස 10 පිළිතුරු

| සහන මරණාධාර සමිතියේ 2019/12/31 අවසන් වර්ෂයේ තත්ත්ව විස්තරය | | |
|---|---|---|
| **වත්කම්** | | |
| ලී බඩු උපකරණ | 50000 | |
| උපකරණ | 15000 | |
| අත ඉතිරි මුදල් | 12000 | |
| ලැබිය යුතු සාමාජික මුදල් | 6000 | |
| බැංකු ගිණුමේ මුදල් | 20000 | |
| | | 103000 |
| **වගකීම්** | | |
| කලින් ලද සාමාජික මුදල් | 3500 | |
| ණය හිමියෝ | 4000 | 7500 |
| සමුච්චිත අරමුදල | | **95500** |
| | | |

## අභ්‍යාස 11

දිලෙන තරු ක්‍රීඩා සමාජයේ 2016/3/31 කින් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු ඔබට සැපයේ 2016 /4/1 දින ක්‍රීඩා සමාජයේ සමුච්චිත අරමුදල කොපමනද?

| | |
|---|---|
| ක්‍රීඩා සමාජයේ ගොඩනැගිල්ල | 63750 |
| ලී බඩු උපකරණ | 25965 |
| ඉදිරියට ගෙවු සාමාජික මුදල් | 3250 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 5250 |
| ගෙවිය යුතු වියදම් | 2500 |
| බීමහල් තොගය | 10265 |
| අතැති මුදල | 2300 |

සමුච්චිත අරමුදල වනුයේ

1 97780 4 106780

2 101780 5 ඉහත කිසිවක් නොවේ

3 91515

## අභ්‍යාස 12

සමනල තරුණ සමාජයේ ගිණුම් පොත් වලින් පහත් තොරතුරු උපුටා ගෙන ඇත

| විස්තරය | 2016/4/1 | 2017/3./31 දිනට |
|---|---|---|
| හිඟ සාමාජික මුදල | රු 40000 | රු30000 |
| කලින් ලලද සාමාජික මුදල් | රු 60000 | - |
| මුදලින් ලද සාමාජික මුදල | රු 360000 | |
| වර්ෂය තුළ කපා හළ සාමාජික මුදල් | රු 10000 | |

වර්ෂයේ සාමාජික මුදල් ආදායම කොපමණද ?

1 440 000
2 420 000
3 340 000
4 400 000
5 380 00

## අභ්‍යාස 12 පිළිතුරු

| සාමාජික මුදල් ගිණුම | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | වටනාකම | දිනය | විස්තරය | වටනාකම |
| 16/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 40000 | 16/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 60000 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල්) | |
| | | | | | |
| | ආදායම් හා වියදම් ගිණුම | 420000 | | මුදල් | 360000 |
| | (ආදායම් ප්‍රකාශය) (1480×30) | | | ආදායම් වියදම් ගිණුම | 10000 |
| | | | 17/3/31 | පහලට ගෙන යන ශෙ | 30000 |
| | | | | (ලැබිය යුතු සාමාජික මුදල්) | |
| | | 460000 | | | 460000 |
| 17/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 30000 | 17/4/1 | | |

## අභ්‍යාස 13

එක්තරා ක්‍රීඩා සමාජයක පහත ශේෂ පැවතුණි

| | 2019/03/31 | 2018/4/1 (රු 000) |
|---|---|---|
| ලැබිය යුතු සාමාජික මුදල් | 80 | 50 |
| කලින් ලද සාමාජික මුදල් | 20 | 30 |

2019/3/31 දිනෙන් අවසන් වර්ෂය තුළ සාමාජික මුදල් රු 400 000 ක් මුදලින් ලැබී ඇති අතර 2018/4/1 දිනට හිඟ සාමාජික මුදල් වලින් රු 25,000 කපා හරින ලදී

2019/3/31 අවසන් වර්ෂය සඳහා ශුද්ධ සාමාජික මුදල් ආදායම කොපමණද?

-----------------------------------

සාමාජික මුදල් කපා හැරීමේ ජනල් සටහන් දක්වන්න

---------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------

## අභ්‍යාස 13 පිළිතුරු

| සාමාජික මුදල් ගිණුම | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
| 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 50000 | 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 30000 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල) | |
| | | | | | |
| | ආදායම් හා වියදම් ගිණුම | 465000 | | මුදල් | 400000 |
| | (ආදායම් ප්‍රකාශය) (1480×30) | | | ආදායම් වියදම් ගිණුම | 25000 |
| | | | 19/3/31 | පහලට ගෙන යන ශේ | 80000 |
| 19/3/31 | පහලට ගෙන යන ශේෂය | 20000 | | (ලැබිය යුතු සාමාජික මුදල්) | |
| | | 535000 | | | 535000 |
| 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 80000 | 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 20000 |

## අභ්‍යාස 14

- 2018/4/1 දින ට සිටි සාමාජිකයින් ගණන් 75 ක්
- 2018 /4/1 දිනට සිටි යාවජීව සාමාජිකයින්ගේ ගණන 30
- 2018 /4/1 නව සාමාජිකයින් 10 බැඳුන අතර එක් අයෙකුගේ වාර්ෂික සාමාජික මුදල **රු 2000**
- 2018/4/1 දිනට පැවති යාවජීව සාමාජික මුදල රු 100000
- 2018/4/1 දින ලැබිය යුතු සාමාජික මුදල් රු 20000
- 2019 වර්ෂය සඳහා මුදලින් ලද සාමාජික මුදල රු180000
- 2019/3/31 කලින් ලද සාමාජික මුදල රුපියල් 10000
- වර්ෂයට අදාළ සාමාජික මුදල් ආදායම හා 2019/03/31 ලැබීය යුතු සාමාජික මුදල්

| | | |
|---|---|---|
| 1 | 230 000 | 20000 |
| 2 | 150000 | 40000 |
| 3 | 240000 | 10000 |

| | | |
|---|---|---|
| 4 | 230000 | 60000 |
| 5 | 180000 | 20000 |

## අභ්‍යාස 14 පිළිතුරු

**සාමාජික මුදල් ගිණුම**

| දිනය | විස්තරය | වටනාකම | දිනය | විස්තරය | වටනාකම |
|---|---|---|---|---|---|
| 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 20000 | 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 0 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල්) | |
| | | | | යාවජීව සාමාජික | 60000 |
| | ආදායම් හා වියදම් ගිණුම | 230000 | | මුදල් | 180000 |
| | (ආදායම් ප්‍රකාශය) (1480×30) | | | ආදායම් වියදම් ගිණුම | |
| | | | 19/3/31 | පහලට ගෙන යන ශෙ | 20000 |
| 19/3/31 | පහලට ගෙන යන ශේෂය | 10000 | | (ලැබිය යුතු සාමාජික මුදල්) | |
| | | 260000 | | | 260000 |
| 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 20000 | 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 10000 |

## අභ්‍යාස 15

පසමිතුරෝ යොවුන් සමිතියෙ 2019/3/31 අවසන් වර්ෂය සඳහා තොරතුරු ලබා දී ඇත

2018/4/1 දිනට ලැබිය යුතු සාමාජික මුදල් රු20000

කලින් ද සාමාජික මුදල් රු30000

වර්ෂය තුළ මුදලින් ලද සාමාජික මුදල රු200000

2019/03/31 දිනට ලැබිය යුතු සාමාජික මුදල රු40000

කලින් ලද සාමාජික මුදල රු20000

අවශ්‍ය වන්නේ

2019/3/31 අවසන් වර්ෂයේ සාමාජික මුදල් ලෙස හඳුනා ගත යුතු ප්‍රමාණය

## අභ්‍යාස 15 පිළිතුරු

| සාමාජික මුදල් ගිණුම | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
| 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 20000 | 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 30000 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල්) | |
| | | | | යාවජීව සාමාජික | |
| | ආදායම් හා වියදම් ගිණුම | 230000 | | මුදල් | 200000 |
| | (ආදායම් ප්‍රකාශය) (1480×30) | | | ආදායම් වියදම් ගිණුම | |
| | | | 19/3/31 | පහලට ගෙන යන ශෙ | 40000 |
| 19/3/31 | පහලට ගෙන යන ශේෂය | 20000 | | (ලැබිය යුතු සාමාජික මුදල්) | |
| | | 270000 | | | 270000 |
| 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 40000 | 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 20000 |

## අභ්‍යාස 16

දිරිය පුරවැසි සමිතියේ 2019/3/31 අවසන් වර්ෂයට අදාලව පහත තොරතුරු සපයා ඇත

- ✓ 2018/4/1 දිනට සාමාජිකයින් ගණන 100
- ✓ 2018/10/1 නව සාමාජිකයින් ලෙස 30 බැඳුණු අතර
- ✓ 2018/4/1 ලැබිය යුතු සාමාජික මුදල් රු 30000
- ✓ 2018/4/1 කලින් ලද සාමාජික මුදල රු 20000
- ✓ 2019/3/31 කලින් ලද සාමාජික මුදල රු 27000
- ✓ 2019/3/31 ලැබිය යුතු සාමාජික මුදල රු 34000
- ✓ වාර්ෂික සාමාජික මුදල රු 2000) කි
  - ➢ මුදලින් ලද සාමාජික මුදල ගණනය කරන

## අභ්‍යාස 16 පිළිතුරු

| සාමාජික මුදල් ගිණුම | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | වටනාකම | දිනය | විස්තරය | වටනාකම |
| 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 30000 | 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 20000 |
| | (ලැබිය යුතු සාමාජික මුදල) | | | (කලින් ලද සාමාජික මුදල්) | |
| | | | | යාවජීව සාමාජික | |
| | ආදායම් හා වියදම් ගිණුම | 230000 | | මුදල් | 233000 |
| | (ආදායම් ප්‍රකාශය) (1480×30) | | | ආදායම් වියදම් ගිණුම | |
| | | | 19/3/31 | පහලට ගෙන යන ශේ | 34000 |
| 19/3/31 | පහලට ගෙන යන ශේෂය | 27000 | | (ලැබිය යුතු සාමාජික මුදල්) | |
| | | 287000 | | | 287000 |
| 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 34000 | 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 27000 |

## අභ්‍යාස 17

**ශක්ති ක්‍රීඩා සමාජයේ 2019 වර්ෂයේ පහත තොරතුරු සපයා ඇත**

| ලැබීම් ගෙවීම් ගිණුම | | | | | |
|---|---|---|---|---|---|
| දිනය | විස්තරය | වටනාකම | දිනය | විස්තරය | වටනාකම |
| 19/1/1 | ඉ/ ගෙ / ශේෂය | 10000 | | පොදු වියදම් | 5000 |
| | සංගීත ප්‍රසංග ආදායම් | 60000 | | ක්‍රීඩා පිටිය නඩත්තු කිරීමේ වියදම් | 20000 |
| | ලද සාමාජික මුදල් | 102000 | | ගෙවල් කුලී | 50000 |
| | | | | දුරකථන | 9000 |
| | | | | ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම් | 50000 |
| | | | 19/12/31 | ප/ ගෙ / ශේෂය | 38000 |
| | | 172000 | | | 172000 |
| 20/12/31 | ඉ/ ගෙ / ශේෂය | 38000 | | | |

| | 2019 /1/1 | 2019/12/31 |
|---|---|---|
| ඉදිරියට ගෙවූ ගෙවල් කුලී | – | 20000 |
| උපචිත දුරකථන ගාස්තු | 2000 | 3000 |
| ක්‍රීඩා උපකරණ (ධාරන අගය ට) | 165000 | 200000 |

**අවශ්‍ය වන්නේ**

2019 /12/31 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන කට්ටලය

## අභ්‍යාස 17 පිළිතුරු

| ශක්ති ක්‍රීඩා සමාජයේ 2019/12/31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය | | |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික මුදල් | 102000 | |
| සංගීත ප්‍රසංග ආදායම් | 60000 | |
| | | 162000 |
| | | |
| **වියදම්** | | |
| පොදු වියදම් | 5000 | |
| ක්‍රීඩා පිටිය නඩත්තු වියදම් | 20000 | |
| ගෙවල් කුලී | 30000 | |
| දුරකථන ගාස්ත | 10000 | |
| ක්‍රීඩා උපකරණ ක්ෂය | 15000 | |
| | | 80000 |
| **අතිරික්තය** | | **82000** |

| ගෙවල් කුලී ගිණුම | | | |
|---|---|---|---|
| ඉ ගෙ ශේෂය | 0 | | |
| මුදල් | 50000 | **ආදායම් ප්‍රකාශය** | **30000** |
| | | ප ගෙ ශේෂය | 20000 |
| | 50000 | | 50000 |
| ඉ ගෙ ශේෂය | 20000 | | |

| දුරකථන ගාස්තු ගිණුම | | | |
|---|---|---|---|
| | | ඉ ගෙ ශේෂය | 2000 |
| මුදල් | 9000 | **ආදායම් ප්‍රකාශය** | **10000** |
| ප ගෙ ශේෂය | 3000 | | |
| | 12000 | | 12000 |
| | | ඉ ගෙ ශේෂය | 3000 |

| ශක්ති ක්‍රීඩා සමාජයේ 2019/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | |
|---|---|---|
| | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| ක්‍රීඩා උපකරණ | | 200000 |
| | | |
| **ජංගම වත්කම්** | | |
| ඉ ගෙවූ ගෙවල් කුලී | 20000 | |
| මුදල් ශේෂය | 38000 | |
| | | 58000 |
| | | 258000 |
| සමුච්චිත අරමුදල | 173000 | |
| **අතිරික්තය** | 82000 | |
| | | 255000 |
| | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| | | |
| | | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත දුරකථන | | 3000 |
| | | 258000 |

| තත්ත්ව විස්තරය | | |
|---|---|---|
| **වත්කම්** | | |
| ලී බඩු උපකරණ | 165000 | |
| අත ඉතිරි මුදල් | 10000 | |
| | | |
| | 175000 | 175000 |
| **වගකීම්** | | |
| උපචිත දුරකථන ලාස්තු | | 2000 |
| | | |
| සමුච්චිත අරමුදල | 0 | **173000** |

## අභ්‍යාස 18

**සහන් ක්‍රීඩා සමාජයේ 2019/12/31 න් අවසන් වර්ෂය සඳහා ලැබීම් ගෙවීම් ගිණුම මෙසේය**

| ලැබීම් ගෙවීම් ගිණුම | | | | | |
|---|---|---|---|---|---|
| **දිනය** | **විස්තරය** | **වටිනාකම** | **දිනය** | **විස්තරය** | **වටිනාකම** |
| **19/1/1** | **ඉ/ ගෙ / ශේෂය** | **24000** | | පොදු වියදම් | 8000 |
| | සංගීත ප්‍රසංග ආදායම් | 62000 | | ක්‍රීඩා උපකරණ මිලදී ගැනීම් | 80000 |
| | ලද සාමාජික මුදල් | 100000 | | ගෙවල් කුලී | 24000 |
| | ආයෝජන ආදායම් | 4000 | | විදුලි ගාස්තු | 18000 |
| | පුවත්පත් විකුණා ලැ: මුදල් | 10000 | | වැටුප් | 10000 |
| | | | | දුරකථන | 20000 |
| | | | | | |
| | | | **19/12/31** | **ප/ ගෙ / ශේෂය** | **40000** |
| | | 200000 | | | 200000 |
| **20/12/31** | **ඉ/ ගෙ / ශේෂය** | **40000** | | | |

**අනෙකුත් ශේෂ මෙසේ ය**

| | **2019 /1/1** | **2019/12/31** |
|---|---|---|
| උපචිත රක්ෂණ වියදම් | 1000 | 2000 |
| උපකරණ ලියා අඩු කළ අගයට | 100000 | 160000 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 2000 | 3000 |

**අවශ්‍ය වන්නේ**

- සහන් ක්‍රීඩා සමාජයේ 2019/12/31 අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
- සහන් ක්‍රීඩා සමාජයේ 2019/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

# අභ්‍යාස 18 පිළිතුර

| සහන් ක්‍රීඩා සමාජයේ 2019/12/31 න් අවසන් වර්ෂය සදහා ආදායම් ප්‍රකාශය | | |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික මුදල් | 101000 | |
| සංගීත ප්‍රසංග ආදායම් | 62000 | |
| ආයෝජන ආදායම් | 4000 | |
| පරණ පත්තර විකුණුම් | 10000 | |
| | 177000 | 177000 |
| | | |
| **වියදම්** | | |
| වැටුප් | 10000 | |
| රක්ෂණ | 9000 | |
| ගෙවල් කුලී | 24000 | |
| දුරකථන ගාස්තු | 20000 | |
| විදුලිය | 18000 | |
| උපකරණ ක්ෂය | 20000 | |
| | 101000 | 101000 |
| **අතිරික්තය** | | **76000** |

| සහන් ක්‍රීඩා සමාජයේ 2019/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | |
|---|---|---|
| | | |
| **ජංගම නොවන වත්කම්** | | |
| ක්‍රීඩා උපකරණ | | 160000 |
| | | |
| **ජංගම වත්කම්** | | |
| ලැ යුතු සාමාජික මුදල් | 3000 | |
| මුදල් ශේෂය | 40000 | |
| | | 43000 |
| | | 203000 |
| සමුච්චිත අරමුදල | 125000 | |
| **අතිරික්තය** | 76000 | |
| | | 201000 |
| | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| | | |
| | | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත රක්ෂණය | | 2000 |
| | | 203000 |

| සාමාජික මුදල් ගිණුම | | | |
|---|---|---|---|
| ඉ ගෙ ශේෂය | 2000 | ඉ ගෙ ශේෂය | 0 |
| ආදායම් ප්‍රකාශය | 101000 | මුදල් | 100000 |
| ප ගෙ ශේෂය | 0 | ප ගෙ ශේෂය | 3000 |
| | 103000 | | 103000 |
| ඉ ගෙ ශේෂය | 3000 | ඉ ගෙ ශේෂය | 0 |

| රක්ෂණ ගාස්තු ගිණුම | | | |
|---|---|---|---|
| | | ඉ ගෙ ශේෂය | 1000 |
| මුදල් | 8000 | ආදායම් ප්‍රකාශය | 9000 |
| ප ගෙ ශේෂය | 2000 | | |
| | 10000 | | 10000 |
| | | ඉ ගෙ ශේෂය | 2000 |

| උපකරණ ගිණුම | | | |
|---|---|---|---|
| ඉ ගෙ ශේෂය | 100000 | ක්ෂය | 20000 |
| මුදල් | 80000 | ප ගෙ ශේෂය | 160000 |
| | 180000 | | 180000 |
| ඉ ගෙ ශේෂය | 160000 | | |

| සහන ක්‍රීඩා සමිතියේ 2019/1/1 දිනට තත්ත්ව විස්තරය | | |
|---|---|---|
| **වත්කම්** | | |
| ක්‍රීඩා උපකරණ | 100000 | |
| ලැ යුතු සාමාජික මුදල් | 2000 | |
| අත ඉතිරි මුදල් | 24000 | |
| | | 126000 |
| **වගකීම්** | | |
| උපචිත රක්ෂණ ගාස්තු | | 1000 |
| | | |
| සමුච්චිත අරමුදල | | **125000** |

## ඇතුලත්වීමේ ගාස්තු

ඇතුලත්වීමේ ගාස්තු ගිණුම් ගත කිරීමේ දී විවිධ ක්‍රම අනුගමනය කරනු දැකිය හැක

ඇතුලත් වීමේ ගාස්තුව **ලද වර්ෂයේ ආදායමක්** සේ සැලකීම

**මුදල්/ලැබීම් ගෙවීම් ගිණුම හර**

**ආදායම් ප්‍රකාශය බැර**

ඇතුලත් වීමේ ගාස්තුව **විශාල වටිනාකමක්** වන අවස්ථාවලදී වාර්ෂිකව සමිතිය තීරණය කරන ප්‍රමාණය වාර්ෂිකව ආදායම් වියදම් ගිණුමට මාරු කරන අවස්ථා ඇත එවැනි අවස්ථාවන්හිදීවකදී

ලැබෙන ඇතුලත් වීමේ ගාස්තුව

**මුදල්/ලැබීම් ගෙවීම් ගිණුම හර**

**ඇතුලත්වීමේ ගාස්තු ගිණුම් බැර**

වාර්ෂිකව ආදායම් වියදම් ගිණුමට මාරු කරන ප්‍රමාණය

**ඇතුලත්වීමේ ගාස්තු ගිණුම් හර**

**ආදායම් වියදම් ගිණුම බැර**

## අභ්‍යාස 19

රන්තරු ක්‍රීඩා සමාජයේ භාණ්ඩාගාරික විසින් 2019/03/31 දිනයෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කළ ලැබීම් හා ගෙවීම් ගිණුම මෙසේය

**ලැබීම් ගෙවීම් ගිණුම**

| දිනය | විස්තරය | වටිනාකම | දිනය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|---|---|
| 18/4/1 | ඉ/ ගෙ / ශේෂය | 21000 | | ක්‍රීඩාගාර සේවකයෙකු වැටුප් | 3000 |
| | පරිත්‍යාග | 30000 | | ක්‍රීඩාංගන කුලී | 26000 |
| | ලද සාමාජික මුදල් | 18000 | | මුද්‍රණ වියදම් | 1250 |
| | බැංකු පොලී | 1000 | | සංග්‍රහ | 4000 |
| | | | | භාණ්ඩාගාරික ප්‍රසාද දීමනා | 2750 |
| | | | | ක්‍රීඩා උපකරණ | 10000 |
| | | | | ලිපි ද්‍රව්‍ය | 2000 |
| | | | | | |
| | | | 19/3/31 | ප/ ගෙ / ශේෂය | 21000 |
| | | 70000 | | | 70000 |
| 19/4/1 | ඉ/ ගෙ / ශේෂය | 21000 | | | |

| | 2018/4/1 | 2019/3/31 |
|---|---|---|
| හිඟ සාමාජික මුදල් | 4000 | 2000 |
| කලින් ලද සාමාජික මුදල් | 1000 | - |
| ගෙවිය යුතු ක්‍රීඩාංගණ කුලී | - | 2000 |
| ක්‍රීඩා උපකරණ | 15000 | 20000 |

**අවශ්‍ය වන්නේ**

- 2018/4/1 දිනට සමුච්චිත අරමුදල
- 2019/3/31 අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය
- 2019/3/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**මෙම අභ්‍යාසය සකස් කර මට Msg කරන්න**

## අභ්‍යාස 19 පිළිතුරු

| රන්තරු ක්‍රීඩා සමාජයේ 2019/3/31 න් අවසන් වර්ෂය සදහා ආදායම් ප්‍රකාශය | | |
|---|---|---|
| **ආදායම්** | | |
| බැංකු පොලී | 1000 | |
| පරිත්‍යාග | 30000 | |
| සාමාජික මුදල් | 17000 | |
| | | |
| | 48000 | 48000 |
| | | |
| **වියදම්** | | |
| ක්‍රීඩාගාර සේවකයෙකු වැටුප් | 3000 | |
| ක්‍රීඩාංගන කුලී | 28000 | |
| සංග්‍රහ | 4000 | |
| භාණ්ඩාගාරික ප්‍රසාද් දීමනා | 2750 | |
| ක්‍රීඩා උපකරණ ක්ෂය | 5000 | |
| ලිපි ද්‍රව්‍ය | 2000 | |
| මුද්‍රණ වියදම් | 1250 | |
| | 46000 | 46000 |
| **අතිරික්තය** | | **2000** |

| රන්තරු ක්‍රීඩා සමාජයේ 2019/3/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| ක්‍රීඩා උපකරණ | | 20000 |
| | | |
| **ජංගම වත්කම්** | | |
| ලැ යුතු සාමාජික මුදල් | 2000 | |
| මුදල් ශේෂය | 21000 | |
| | | 23000 |
| | | 43000 |
| සමුච්චිත අරමුදල | 39000 | |
| **අතිරික්තය** | 2000 | |
| | | 41000 |
| | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| | | |
| | | |
| **ජංගම වගකීම්** | | |
| උපචිත කුලී | | 2000 |
| | | 43000 |

**සාමාජික මුදල් ගිණුම**

| දිනය | විස්තරය | වටනාකම | දිනය | විස්තරය | වටනාකම |
|---|---|---|---|---|---|
| 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 4000 | 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 1000 |
| | | | | යාවජීව සාමාජික | |
| | ආදායම් හා වියදම් ගිණුම | 17000 | | මුදල් | 18000 |
| | | | | ආදායම් වියදම් ගිණුම | |
| 19/3/31 | පහලට ගෙන යන ශේෂය | | 19/3/31 | පහලට ගෙන යන ශේෂය | 2000 |
| | | 21000 | | | 21000 |
| 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 2000 | 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 0 |

| රන්තරු ක්‍රීඩා සමිතියේ 2018/4/1 දිනට තත්ත්ව විස්තරය | | |
|---|---|---|
| **වත්කම්** | | |
| ක්‍රීඩා උපකරණ | 15000 | |
| ලැ යුතු සාමාජික මුදල් | 4000 | |
| අත ඉතිරි මුදල් | 21000 | |
| | 40000 | 40000 |
| **වගකීම්** | | |
| කලින් ලද සාමාජික මුදල් | | 1000 |
| | | |
| **සමුච්චිත අරමුදල** | 0 | **39000** |

## අභ්‍යාස 20

**සමගි ක්‍රීඩා සමාජයේ 2019/3/31 දිනට උපුටා ගත් ශේෂ පිරික්සුම මෙසේය.**

| | | |
|---|---|---|
| 2018/4/1 දිනට හිඟ සාමාජික මුදල් | 12000 | |
| කලින් ලද සාමාජික මුදල් | | 5000 |
| ක්‍රීඩා තරඟ වියදම් | 15000 | |
| ලද සාමාජික මුදල් | | 46000 |
| නඩත්තු වියදම් | 9000 | |
| දුරකථන වියදම් | 6400 | |
| පරණ පුවත්පත් විකුණුම් ආදායම් | | 2400 |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 2000 | |
| අතැති මුදල් | 6000 | |
| ක්‍රීඩාගාරය | 100000 | |
| ක්‍රීඩා පිටිය | 150000 | |
| ක්‍රීඩා උපකරණ | 50000 | |
| ක්‍රීඩා තරඟ ආදායම් | | 25000 |
| බැංකු ණය | | 40000 |
| යාවජීව සාමාජික මුදල් | | 27000 |
| සමුච්චිත අරමුදල | | 205000 |
| | **350400** | **350400** |

**අතිරේක තොරතුරු**

- ✓ ලද සාමාජික මුදල් වලින් රු 4000 2019/20 වර්ෂය සඳහා ය.
- ✓ 2018/19 සඳහා රු 5,000 සාමාජික මුදල් හිඟ ව ඇත .
- ✓ 2018/4/1 දිනට හිඟව තිබුණු සාමාජික මුදල් වලින් රු 3000 ක් ලැබුන අතර එය සාමාජික මුදල් වල ඇතුළත් ය .
- ✓ යාවජීව සාමාජික මුදල් වලින් රු 4200 මෙම වර්ෂයේ ආදායමක් ලෙස ගත යුතුය .
- ✓ ක්‍රීඩාගාරයට 5% ද ක්‍රීඩා උපකරණ 10% ක්ෂය කරන්න.

**අවශ්‍ය වන්නේ**

2019/03/31 න් අවසාන වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය.

2019 3.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය .

**මෙම අභ්‍යාසය සකස් කර මට Msg කරන්න**

| සමගි ක්‍රීඩා සමාජයේ 2019/3/31 න් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය | | |
|---|---|---|
| **ආදායම්** | | |
| ක්‍රීඩා තරඟ ආදායම් | 25000 | |
| පරණ පත්තර විකුණුම් | 2400 | |
| සාමාජික මුදල් | 49000 | |
| යාවජීව සාමාජික මුදල් | 4200 | |
| | | 80600 |
| | | |
| **වියදම්** | | |
| ක්‍රීඩා තරඟ වියදම් | 15000 | |
| ක්‍රීඩා උපකරණ ක්ෂය | 5000 | |
| නඩත්තු වියදම් | 9000 | |
| දුරකථන වියදම් | 6400 | |
| ක්‍රීඩාගාර ක්ෂය | 5000 | |
| ලිපි ද්‍රව්‍ය වියදම් | 2000 | |
| | | |
| | 42400 | 42400 |
| **අතිරික්තය** | | **38200** |

| | | |
|---|---|---|
| 17/18 | ට හිඟ | 5000 |
| 2018/19 සඳහා හිඟ | | 9000 |
| | | 14000 |

| සමගි ක්‍රීඩා සමාජයේ 2019/3/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | | |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| ක්‍රීඩා පිටිය | 150000 | |
| ක්‍රීඩාගාරය | 95000 | |
| ක්‍රීඩා උපකරණ | 45000 | 290000 |
| **ජංගම වත්කම්** | | |
| ලැ යුතු සාමාජික මුදල් | 14000 | |
| මුදල් ශේෂය | 6000 | |
| | | 20000 |
| | | 310000 |
| සමුච්චිත අරමුදල | 205000 | |
| අතිරික්තය | 38200 | |
| **යාවජීව සාමාජික මුදල්** | **22800** | |
| | | 266000 |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | | 40000 |
| | | |
| **ජංගම වගකීම්** | | |
| කළින් ලද සාමාජික මුදල් | | 4000 |
| | | 310000 |

## සාමාජික මුදල් ගිණුම

| දිනය | විස්තරය | වටනාකම | දිනය | විස්තරය | වටනාකම |
|---|---|---|---|---|---|
| 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 12000 | 18/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 5000 |
| | | | | යාවීජීව සාමාජික | |
| | ආදායම් හා වියදම් ගිණුම | 49000 | | මුදල් | 46000 |
| | | | | ආදායම් වියදම් ගිණුම | |
| 19/3/31 | පහලට ගෙන යන ශේෂය | 4000 | 19/3/31 | පහලට ගෙන යන ශේෂය | 14000 |
| | | 65000 | | | 65000 |
| 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 14000 | 19/4/1 | ඉදිරියට ගෙන ආ ශේෂය | 4000 |

## යාව ජිව සාමාජික මුදල් ගිණුම

| දිනය | විස්තරය | වටනාකම | දිනය | විස්තරය | වටනාකම |
|---|---|---|---|---|---|
| | සාමාජික මුදල් | 4200 | | මුදල් | 27000 |
| | **පහලට ගෙන යන ශේෂය** | 22800 | | | |
| | | 27000 | | | 27000 |
| | | | | **ඉදිරියට ගෙන ආ ශේෂය** | 22800 |

## පරිත්‍යාග

ලාභ අරමුණු කර නොගත් සංවිධාන වලට විවිධ පරිත්‍යාග ලැබේ· මෙවැනි පරිත්‍යාග ප්‍රධාන කොටස් දෙකකට වර්ග කළ හැක·

- සාමාන්‍ය පරිත්‍යාග
- විශේෂ පරිත්‍යාග

### සාමාන්‍ය පරිත්‍යාග

ඕනෑම කාර්යකට යොදාගත හැකි පරිත්‍යාග සාමාන්‍ය පරිත්‍යාග වේ· මෙම මුදල් ලැබූ වර්ෂයේම ආදායමක් ලෙස සලකා ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ·

ලැබීම් හා ගෙවීම් ගිණුම හර
ආදායම් වියදම් ගිණුම බැර

### විශේෂ පරිත්‍යාග

යම් නිශ්චිත කාලයක් සඳහා හෝ යම් නිශ්චිත පරමාර්ථයක් ඉටුකර ගැනීම සඳහා ලැබෙන පරිත්‍යාග විශේෂ පරිත්‍යාග ලෙෂ හැඳින්වේ

උදාහරණ ෑ

ගොඩනැගිලි අරමුදලට

මෝටර් රථ පරිත්‍යාග

පුස්තකාල අරමුදලට ලැබෙන පරිත්‍යාග

මේ අරමුදල් යම් නිශ්චිත කාරණයට යොදා ගන්නා තෙක් මෙම අරමුදල් ඉදිරියට ගෙන යන අතර එය මූල්‍ය තතත්ව ප්‍රකාශයෙ සමුච්චිත අරමුදල් යටතේ පෙන්විය යුතුය·

### මුදල් හෝ වත්කම් ලැබෙන විට

මුදල් / වත්කම් ගිණුම් හර
අදාල අරමුදල් ගිණුම බැර

### අරමුදලෙ ඇති මුදල් අදාල වත්කම සඳහා යොදා ගන්නා ගන්නා විට

අදාළ වත්කම් ගිණුම හර
ලැබිම් ගෙවීම් / මුදල් ගිණුම බැර

### අරමුදල ඒ කාර්යය නිම කළ ප්‍රමාණය

අරමුදල ගිණුම් හර
ආදායම් වියදම් ගිණුම් බැර

## බාහිර ක්‍රියා ක්‍රියාකාරකම් ගැලපීම්

ලාභ අරමුණුකර නොගත් ව්‍යාපාර සිය දියුණුව හා සංවර්ධනය සඳහා ප්‍රධාන අරමුණ ට අමතරව ලාභ අරමුණු සහිතව බාහිර ක්‍රියාකාරකම් වල නිරත වේ

**උදාහරණ**

- ආපනශාලා පවත්වාපශාලා පවත්වාගෙන යාම
- සංගීත සංදර්ශන පැවැත්වීම
- ක්‍රීඩා තරග පැවැත්වීම

මේවයායේ ප්‍රතිඵල **වෙනම ආදායම් ප්‍රකාශයක** ගණනය කර ආදායම් වියදම් ගිණුමට ගළපනු ලැබේ

# අභ්‍යාස 21

සුමුදු ක්‍රීඩා සමාජයේ පොත් වලින් උපුටා ගත් ශේෂයන් මෙසේය

| | 2019/1/1 | 2019/12/31 |
|---|---|---|
| ක්‍රීඩා උපකරණ | 30000 | 34000 |
| බීම තොගය | 25000 | 15000 |
| ඉදිරියට ගෙවූ බීමහලේ බදුකුලී | 3000 | 2000 |
| හිඟ සාමාජික මුදල් | 8000 | 5000 |
| මුදල් හා බැංකු | 30000 | ? |
| බීම මහලේ ණය හිමියෝ | 20000 | 28000 |
| බීම හලේ වියදම් | 4000 | 6000 |
| කලින් ලද සාමාජික මුදල් | 5000 | 3000 |
| බීම හලේ උපකරණ | - | 30000 |
| 15% ස්ථාවර තැන්පතු | 60000 | 60000 |

2019 වසරේ ලැබීම් ගෙවීම් ගිණුම මෙසේය

**ලැබීම් ගෙවීම් ගිණුම**

| දිනය | විස්තරය | වටනාකම | දිනය | විස්තරය | වටනාකම |
|---|---|---|---|---|---|
| 19/1/1 | ඉ/ ගෙ / ශේෂය | 30000 | | බීම හලේ බදු කුලී | 39000 |
| | පරිත්‍යාග | 15000 | | ක්‍රීඩා උපකරණ මිලදී මිලදී ගැනීම් | 10000 |
| | ලද සාමාජික මුදල් | 52000 | | බිමහලේ අත්පිට ගැනුම් | 20000 |
| | බීම විකුණුම් | 175000 | | ක්‍රීඩා තරඟ වියදම් | 20000 |
| | ආයෝජන ආදායම් | 6000 | | බීම හලේ ණයහිමි ගෙවීම | 42000 |
| | | | | බීම හලේ උපකරණ | 34000 |
| | | | | පුවත්පත් වියදම් | 3000 |
| | | | | බීමහලේ වියදම් | 15000 |
| | | | 19/12/31 | **පා/ ගෙ / ශේෂය** | **95000** |
| | | 278000 | | | 278000 |
| 20/1/1 | ඉ/ ගෙ / ශේෂය | 95000 | | | |

**අවශ්‍ය වන්නේ**

- 2019/12/31 න් අවසන් වර්ෂයට බීම හලෙහි ආදායම් ප්‍රකාශය
- සාමාජික මුදල් ගිණුම
- 2019/12/31 න් අවසන් වර්ෂයට ආදායම් වියදම් ගිණුම
- 2019/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
- **මෙම අභ්‍යාසය සකස් කර මට Msg කරන්න**